# හානිපූරණය සඳහා වන කාර්යාලය

# පුරප්පාඩු පිරවීම

## 01. තනතුර - නියෝජ්‍ය අධ්‍යක්ෂ - (මුදල්)

**තනතුරු සංඛ්‍යාව - 01**

**අධ්‍යාපන සුදුසුකම් :**

i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය,

හෝ

ii. පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරි ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය,

හෝ

iii. පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනය අන්තර් මධ්‍ය පරීක්ෂණය.

හෝ

iv. සහතික ලත් වරලත් ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය,

හෝ

v. එක්සත් රාජධානියේ සහතික ලත් වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වීම.

හෝ

vi. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය/ කළමනාකරණය/ ගණකාධිකරණය/ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් සහිතව,

vii. රාජ්‍ය/අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයක ගණකාධිකරණය හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයෙහි තනතුරක වසර දහයක (10) පළපුරුද්ද ලබා තිබීම.

හෝ

viii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය (HNDA) හෝ ගිණුම් පිළිබඳ අවසන් සහතික පත්‍ර පාඨමාලාව (HNCA) සහිතව රාජ්‍ය/අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයක ගණකාධිකරණය හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයෙහි තනතුරක වසර දහයක (10) පළපුරුද්ද ලබා තිබීම.

**වයස් සීමාව :**

2021/03/01 දිනට අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාවේ බලපෑමක් නොමැත.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 2/2016 අනුව 2020/01/01 දිනට වැටුප් පියවර රු. 68,835/= MM 1-1-2016 - 68,835-1910X15-95,575 ක් සහ රජයේ අනුමත දීමනාවන් හිමි වේ.

මෙම තනතුර ස්ථිරය, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් ලබයි.

රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

**ඉල්ලුම්පත් -**

සභාපති, හානිපූරණය සඳහා වන කාර්යාලය, අංක - 408, ගාලු පාර, කොළඹ - 03. යන ලිපිනයට **2021/03/01** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"නියෝජ්‍ය අධ්‍යක්ෂ - (මුදල්) තනතුර සඳහා අයදුම්පත්‍රය"** යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.

**සභාපති,**
**හානිපූරණය සඳහා වන කාර්යාලය,**
**අංක - 408, ගාලු පාර,**
**කොළඹ - 03.**